# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } SGLG/RT/A/BLUC/FA/A$_3$/05/2023/11 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 අප්‍රේල් 30 දින.

9606
24 JUN 2024
බලන්ගොඩ

ලේකම්,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

වී.පී.එම්. කුමානායක,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත :- පළාත් පාලන කොමසාරිස්, සබරගමුව පළාත් සභාව - කා.දැ.පි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය
எனது இல.
My No.
SGLG/RT/A/BLUC/FA/A$_3$/05/2023/11

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date
2024 අප්‍රේල් 30 දින.

ලේකම්,

බලංගොඩ නගර සභාව.

**බලංගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

බලංගොඩ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යන්ත්‍රෝපකරණ නඩත්තු වියදම් රු.113,250ක් ප්‍රාග්ධනිත කර තිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉඩම් හා ගොඩනැගිලි එකතුකිරීම් රු.6,962,859ක් වුවද, එය රු.7,604,692ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් ජංගම නොවන වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමෙන් දායක වීමේ ගිණුම රු.641,893ක් වැඩියෙන් දැක්වුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඈ) මුලත්ගම පොදු සුසාන භූමියේ මායිම් තාප්පය අලුත්වැඩියා කිරීම සඳහා ගෙවිය යුතු ශේෂය රු.2,381,720ක් වුවද, එය රු.2,977,159ක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා කර්මාන්ත ණයහිමියෝ රු.595,431ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක හා අවසාන ආයුර්වේද බෙහෙත් තොගය පිළිවෙලින් රු.322,556ක් හා රු.303,616ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, වර්ෂය තුළ මිලදී ගැනීම් රු.599,725ක් වර්ෂයේ වියදමට හර කර තිබුණි. එම නිසා වර්ෂයේ මෙහෙයුම් වියදම රු.18,940ක් ද ජංගම වත්කම් රු.303,616 ක් හා සමුච්චිත අරමුදල රු.322,556ක් ද අඩුවෙන් දැක්වුණි.

(ඉ) ඉකුත් වර්ෂයේදී කර්මාන්ත ණයහිමියන්ට ගෙවන ලද රු.1,392,773ක් 2023 දෙසැම්බර් 31 වන විටත් ගෙවිය යුතු ලෙස දක්වා තිබීම නිසා කර්මාන්ත ණයහිමි ශේෂය එම වටිනාකමින් වැඩියෙන් හා සමුච්චිත අරමුදල සමාන වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත දෙකක් සඳහා ගෙවිය යුතු වටිනාකම රු.4,590,891ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා කර්මාන්ත ණයහිමියෝ එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේදී ලැබී තිබුණු කර්මාන්ත ණයගැති ලැබීම් රු.108,109ක් ලැබිය යුතු ලෙස නැවත ගිණුම්ගතකර තිබීමෙන් ජංගම වත්කම් හා සමුච්චිත අරමුදල එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැකෝ යන්ත්‍රය වෙනුවෙන් තබන ලද ඇප මුදල් රු.250,000ක් ආදායමට හිලව් කර තිබුණද, එය ගිණුම්ගතකර නොතිබීමෙන් එම වටිනාකමින් ජංගම බැරකම් වැඩියෙන් සහ මෙහෙයුම් ආදායම අඩුවෙන් දැක්වුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු උපයෝගිතා සේවා වියදම රු.742,500ක් නැවත වියදම් ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ මෙහෙයුම් වියදම හා ජංගම බැරකම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) ඉදිරි වර්ෂය සඳහා ගෙවූ රක්ෂණ වියදම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා වර්ෂයේ මෙහෙයුම් වියදම රු.196,596කින් වැඩියෙන් දැක්වුණු අතර ජංගම වත්කම් සමාන වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඔ) ගිණුම් විෂයයන් 03කට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.3,024,685ක වෙනසක් විය.

(ඖ) එකතුව රු.498,499,763ක් වූ ගිණුම් විෂයයන් 04ක යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.905,463ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,227,487ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු ,හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 13,145,000 | 11,352,210 | 11,452,200 | 6,119,239 | 10,777,000 | 11,611,507 | 12,335,139 | 6,156,320 |
| කුලී | 37,792,000 | 41,884,327 | 41,395,622 | 488,705 | 36,096,000 | 35,675,467 | 34,481,551 | 860,427 |
| බලපත්‍ර ගාස්තු | 2,690,000 | 2,077,137 | 2,135,001 | - | 2,285,000 | 1,534,728 | 1,379,728 | - |
| වෙනත් ආදායම් | 29,501,000 | 29,180,168 | 35,278,760 | - | 27,030,000 | 24,701,612 | 24,957,583 | - |
| | 83,128,000 | 84,493,842 | 90,261,583 | 6,607,944 | 76,188,000 | 73,523,314 | 73,154,001 | 7,016,747 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කළ ආදායම සමඟ සැසඳීමේදී බලපත්‍ර ගාස්තු සහ සේවා සඳහා ගාස්තු යන ආදායම් විෂයයන්ගෙන් රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 03කින් හා 19කින් වැඩි වී තිබුණු අතර, වරිපනම් හා බදු, බදු කුලී ආදායම, වරෙන්තු හා දඩ, වෙනත් ආදායම් සහ රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කළ ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා සියයට 13කින්, 01කින්, 35කින්, 54කින් සහ 06කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.6,119,240ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. එමෙන්ම හිඟ ශේෂ අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 වගන්තිය ප්‍රකාරව සභාව කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී

සභාවට අයත් සම්පත් පියසට යාබද කඩකාමරය ටෙන්ඩර් කිරීමකින් තොරව 2017 පෙබරවාරි මාසයේදී වාර්ෂික බදු ලබා දී තිබුණි. එදින සිට වාර්ෂික ගාස්තු සංශෝධනය කරමින් හා ගිවිසුම් අලුත්කරමින් ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව එම පුද්ගලයා වෙතම බදුදීමට කටයුතු කර තිබුණි.

2.2.5 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඩිජිටල් ප්‍රචාරන දැන්වීම් වර්ග අඩියක් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා 2021 හා 2022 වර්ෂවලදී රු.80ක් ද, 2023 වර්ෂයේදී රු.200ක් ද, වශයෙන් ගාස්තු අයකරන බව ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කර තිබියදී, නගර සීමාව තුළ ප්‍රදර්ශනය කර තිබුණු ඩිජිටල් දැන්වීම් පුවරුවක වර්ග අඩි ප්‍රමාණය නොසලකා වර්ෂයකට රු.45,600ක් පමණක් අයකිරීම හේතුවෙන් 2021 ජුලි සිට 2023 ජුලි දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.510,720ක ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) සභාව විසින් කපා ඉවත් කරන ලද අනතුරුදායක ගස් වෙනුවෙන් අයවිය යුතු රු.53,350ක් ආණ්ඩුකාරවර අනුමැතියට යටත්ව අය නොකර සිටීමට 2022 නොවැම්බර් මස සභාව තීරණය කර තිබුණද, 2023 නොවැම්බර් වන විටත් ආණ්ඩුකාරවර අනුමැතිය ලැබී නොතිබුණි.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරය) 136 වගන්තියේ (අ) ප්‍රකාරව පොදු වෙළඳපලවල් පිහිටුවීම හා පවත්වාගෙන යෑම සභාව විසින් සිදුකළ යුතු කාර්යයක් වුවත්, බලංගොඩ පොදු වෙළඳපලේ අධීක්ෂණය හා නඩත්තු කටයුතු දුර්වල තත්ත්වයක පැවැතිණි.

(ආ) 2019 වර්ෂයේ වරිපනම් පද්ධතිය සැකසීම සඳහා ගෙවීම් කළ රු.200,000ක් පසුව, තැන්පත් ගිණුමට බැරකර තිබුණි. එහෙත් එම මුදල මේ දක්වා ආදායමට බැර කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු වලට අදාළ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව තිබුණද, සිය විෂයය පථයට අනුව ළඟාකර ගතයුතු තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟාවිය යුතු සංදිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ඇතුළත් දිගුකාලීන සැලසුම් සකස් කර නොතිබුණි.

#### (ආ) පොදු උපයෝගිතා සේවා

වෙනයම් අධිකාරියකට නීතියෙන් අයිති බලතලවලට සහ වගකීම්වලට යටත්ව, නගරය ඇතුළත වූ සියළුම මංමාවත් හා වැසි ජල කාණු නඩත්තුව හා වැඩිදියුණු කිරීම සභාවේ වගකීමක් වුවද, 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ගවල විධිමත් වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමේ ප්‍රගතිය සියයට 20ක් වැනි අවම මට්ටමක පැවති අතර, මාර්ග හා වැසි ජල කාණු නඩත්තු කටයුතුවල ප්‍රගතිය ද සියයට 54ක් වැනි අඩු මට්ටමක පැවැතිණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

සභාව සඳහා අනුමත ආදායම් පරීක්ෂක තනතුරු 03ක්, මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර හා ඖෂධ සංයෝජක තනතුර පුරප්පාඩුව පැවතීම ආදායම් රැස්කිරීම, මහජන සෞඛ්‍ය ආරක්ෂාව හා නියාමන කටයුතු මෙන්ම සකල කළමනාකරණ කටයුතු කෙරෙහි ද අහිතකර ලෙස බලපා තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නඩත්තු හා අලුත්වැඩියා සිදු නොකිරීම

සභාව සතු බලංගොඩ නානායම අලුත්වැඩියා කටයුතු සඳහා 2023 පෙබරවාරි 22 දින සිට වසා දමා තිබුණ ද, 2023 ඔක්තෝබර් වන විටත් අලුත්වැඩියා කටයුතු ආරම්භ කර නොතිබුණි. අලුත්වැඩියා කටයුතු කඩිනම් නොකිරීම හේතුවෙන් මාසිකව රු.300,000ක පමණ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ආ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

ක්‍රීඩා පිටියක් සඳහා 2020 පෙබරවාරි 18 දින රු.257,500කට මිලට ගන්නා ලද බල්බ 20ක් හා 2019 හා 2020 වර්ෂවල දී ලද රු.128,375ක විදුලි උපාංග මේ දක්වාම අභාවිතව පැවතිණි.

3.4 ප්‍රසම්පාදනය

LED 12w විදුලි බල්බ 100ක් සහ හෝල්ඩර් 20ක් මිලදී ගැනීමට ආයතන 05කින් මිල ගණන් කැඳවා තිබුණි. මිල ගණන් භාර ගැනීමේ අවසාන දිනය 2023 පෙබරවාරි 09 වුවද, එදින ප.ව. 03.00ට පවත්වන ලද ප්‍රසම්පාදන කමිටුවේදී 2023 පෙබරවාරි 10 හා 20 දිනැතිව ලැබී තිබුණු මිල සැඳහුම් ද ඇගයීම් කර තිබීම විගණනයේදී ප්‍රශ්නගත විය. එමෙන්ම, අවම මිල ගණන් ඉදිරිපත් කර තිබුණු ආයතනයෙන් භාණ්ඩ මිලදී නොගැනීම නිසා රු.44,200ක අලාභයක් සිදුව තිබුණි.

3.5 අවිධිමත් ගනුදෙනු

බස් නැවතුම්පල පදික කඩකාමර හිමියන් විසින් 2022 ඔක්තෝබර් 31 දිනැතිව ඉදිරිපත් කර තිබුණු ඉල්ලීමක් අනුව එම කඩකාමරවලට පිටුපසින් වතුර කාන්දුවීම වැළැක්වීම සඳහා ඔවුන්ගේ වියදමින් බැම්මක් හා කාණුවක් ඉදිකිරීම සඳහා 2022 නොවැම්බර් 08 දින මහා සභා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව පැති බැම්ම හා කාණු පද්ධතිය සකස් කිරීම සඳහා සභාවේ වැඩ අධිකාරී විසින් රු.4,958,000ක ඇස්තමේන්තුවක් හා සැළැස්මක් සකස් කර තිබුණි. එම සැළැස්ම අනුව පැති බැම්ම හා කඩකාමර අතර කාණුව ඉදිකළ යුතුව පැවතියද, ඊට පටහැනිව පැති බැම්මට පිටතින් සභාවේ ආයුර්වේදය පවතින ඉඩම තුළ කාණුව ඉදිකර තිබුණි. වැඩ අධිකාරීගේ සැළසුම්වලට හා උපදෙස්වලට පටහැනිව කොන්ත්‍රාත්කරු කටයුතු කිරීම නිසා සභාපතිවරයා වෙත දන්වා ඔහු අධීක්ෂණ කටයුතුවලින් ඉවත් වී තිබුණු අතර, සභාපතිවරයාගේ වාචික එකඟතාවය මත ආයුර්වේද ඉඩම තුළ කාණුව ඉදිකළ බවට කඩ හිමියන් ප්‍රකාශ කර තිබුණි. පසුව පැති බැම්ම හා කඩකාමර අතර ඇතිව තිබුණු අලුත් ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගනිමින් කඩකාමර පුළුල් කර ගැනීම සඳහා 2023 පෙබරවාරි 23 දින පැවති මහා සභාව අනුමැතිය ලබා දී තිබුණි. කඩකාමර පුළුල්වීම හේතුවෙන් නව තක්සේරුවක් සිදුකර ගාස්තු අයකිරීමට ආණ්ඩුකාරවර උපදෙස් ලැබී තිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 77කට අදාළව එකතුව රු.106,447,000ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 60කට අදාළව එකතුව රු.71,108,000ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි.

ටී.පී.එම්. කුමානායක.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

වී.වී.කරුණාරත්න සහ සමාගම

මෝටර් ග්‍රේඩරය සහ ගල් රෝල කුලියට ලබාදීම

| කාලය | යන්ත්‍රය | ඒකක ගණන | මුදල | ඉන්ධන වියදම | අයවිය යුතු මුදල | තැන්පතු | ගෙවූ මුදල | ලදුපත් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 2022.04.22 සිට | මෝටර් ග්‍රේඩරය | 50.5 | 302,950.00 | 100,680.00 | 202,270.00 | | 100000.00 | 92322 / 22.06.03 |
| 2022.05.31 | ගල් රෝල | 19.4 | 112,640.00 | 54,000.00 | 58,640.00 | 100000.00 91619/22.04.07 | | |
| 2022.06.01 සිට | මෝටර් ග්‍රේඩරය | 17.8 | 115,700.00 | 48,000.00 | 67,700.00 | | | |
| 2022.06.08 | ගල් රෝල | 17.2 | 101,480.00 | 50,000.00 | 51,480.00 | | | |
| | මෝටර් ග්‍රේඩරය | 47.3 | 307,450.00 | 164,600.00 | 142,850.00 | | 233930.00 | 93455 / 22.08.19 |
| 2022.06.08 සිට 2022.09.07 | ගල් රෝල | 58.6 | 345,740.00 | 168,990.00 | 176,750.00 | | 327920.00 | 94132 / 22.09.29 |
| 2022.09.07 සිට 2022.09.30 | මෝටර් ග්‍රේඩරය | 100.3 | 651,950.00 | 283,800.00 | 368,150.00 | | | |
| | ගල් රෝල | 78.1 | 460,790.00 | 238,650.00 | 222,140.00 | | | |
| 2022.10.03 - 2022.10.31 | මෝටර් ග්‍රේඩරය | 64.5 | 419,250.00 | 194,225.00 | 225,025.00 | | | |
| | ගල් රෝල | 37.2 | 219,480.00 | 89,700.00 | 129,780.00 | | | |
| 2022.11.01 - 2022.11.28 | මෝටර් ග්‍රේඩරය | 71.9 | 467,350.00 | 219,550.00 | 247,800.00 | | 628130.00 | 95002 / 22.11.11 |
| | ගල් රෝල | 62 | 365,800.00 | 170,050.00 | 195,750.00 | | 799705.00 | 95927 / 22.12.27 |
| 2022.12.13 - 2022.12.23 | මෝටර් ග්‍රේඩරය | 21.7 | 141,050.00 | 58,800.00 | 82,250.00 | | | |
| | ගල් රෝල | 21.2 | 125,080.00 | 58,800.00 | 66,280.00 | 250000/97030-23.02.08 | 150000.00 | 97029 / 23.02.08 |
| 2023.03.07 - 2023.03.31 | මෝටර් ග්‍රේඩරය | 97 | 630,500.00 | 271,825.00 | 358,675.00 | | | |
| | ගල් රෝල | 70.2 | 414,180.00 | 196,100.00 | 218,080.00 | | | |
| 2023.04.01 - 2023.06.04 | මෝටර් ග්‍රේඩරය | 67.3 | 437,450.00 | 164,400.00 | 273,050.00 | | 571785.00 | 99209 - 23.05.31 |
| | ගල් රෝල | 58.7 | 346,330.00 | 120,900.00 | 225,430.00 | | 84946.00 | 101193 -23.10.02 |
| | | | | | | | 63534.00 | 104563 -24.02.26 |
| | | | 5,965,170.00 | 2,653,070.00 | 3,312,100.00 | 350,000.00 | 2,959,950.00 | |
| | | | | | **3,312,100.00** | | **3,309,950.00** | |

* 2023.03.07 සිට 2023.03.31 දක්වා කාලය තුළ බිල්පතෙහි අගය (රු 358675.00+218080.00) රු. 576755.00 ක් වුවද එම කාලය තුළ යන්ත්‍රයේ එන්ජින් ඔයිල් සහ ෆිල්ටර් මාරු කිරීමට යාමේදී වැය වූ මීටරයේ අගය අඩුකර එම සමාගම විසින් රු.571785.00 ක් ගෙවීම් කර ඇත.

**මෙම බිල් කිරීම හා ගෙවීම (රු.3312100.00 - 3309550.00= 2150.00) අනුව රු.2150.00 ක හිඟයක් තිබුනද ඉහත කරුණට අනුව ඒකක 1 ක අගය අඩුවී ඇති බැවින් වැඩිපුර මුදලක් අය වී ඇත.

මුල් පිටපත
**Original**

20.23......... මාසයේ ..03.......... වැනි දා වෙනුවෙන් ධාවන සටහන

Running Chart for ______ day of ______ 2023

පොදු 268 වැනි ආකෘති පත්‍රය
Form General 268

16984

දෙපාර්තමේන්තුවේ නම / Name of Department } [illegible]

දෙපාර්තමේන්තු/ලියාපදිංචි කළ අංකය / Department / Registration No. } 2H- 5326

| ගියේ මොන ප්‍රයෝජනයකටද, පත වග, පැටවූ බඩුත් නොහොත් බඩු ආදියේ විස්තර Purpose of trip, Nature of Load, & C | වේලාව TIME | | මාර්ගය ROUTE | | | සැතපුම් ගණන Mileage | වාහනය පාවිච්චි කරන නිලධාරියාගේ කෙටි අත්සන Initials of Officer using vehicle |
|---|---|---|---|---|---|---|---|
| | පිටවූ Out | පැමිණියාවූ In | කොතැනින්ද/ කොතනටද From/ To | ගියතැන් Places Visited | කොයි පාරෙන්ද යන වග Via | | |
| 03/30 | 08.00 | 18.00 | ABC ත., [illegible] | | | 3.3 | (signature) |
| 03/31 | 8.00 | 17.00 | ABC ත., [illegible] | | | 2.2 | (signature) |
| | | | | | | | |
| | | | | | | | |

රියදුරාගේ නම / Name of Driver } KM.C. [illegible]

| | | | |
|---|---|---|---|
| දිනය Date | 03/30 | 03/31 | |
| මයිලෝමීටරයෙහි සඳහන් සැතැප්ම ගණන - පිටත්වන විට Milometer Reading-Out | 1360.7 | 1364.0 | |
| එම Do / පැමිණෙනවිට In | 1364.0 | 1366.7 | |
| දිවූ සැතැප්ම ගණන Mileage | 3.3 | 2.2 | |
| ගැලුමකට සැතැප්ම ගණන Miles per Gallon | 7 | 7 | |
| රියදුරාගේ කෙටි අත්සන Initials of Driver | (signature) | (signature) | |

| | | | |
|---|---|---|---|
| දිනය Date | 03/30 | 03/31 | |
| ඉන්ධන තිබුණ ප්‍රමාණය Fuel Position | 0.0 | 6.9 | 31.5 |
| ටැංකියේ ගැලුම් In Tank Gallons | | | |
| ගත්තා Drawn | 30 | 40 | |
| පාවිච්චි කළ Consumed | 23.1 | 15.4 | |
| ඉතුරුව තිබෙන හරිය Balance | 6.9 | 31.5 | |
| එන්ජින් තෙල් Engine Oil | | | |
| ගත්තා පයින්ට් Drawn Pints | | | |
| වාහනය බාර නිලධාරියාගේ කෙටි අත්සන Initials of O.I.C. | (signature) | (signature) | |

ඔඩරයේ අංකය හා දිනය
Order No. and Date

වෙනත් කිව යුතු දේ
**REMARKS**

03/31 [illegible]
[illegible] (මීටරය = 1365.0)